2024. 12. 20 දිනමිණ. පිටු 14

# ජන හා නිවාස සංගණනය **සාර්ථකව අවසන්**

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් **අනෝජා සෙනෙවිරත්න**



**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවේ 15 වැනි ජන හා නිවාස සංගණනය සාර්ථකව අවසන් කළ අතර, එම සංගණනයට අදාළ මූලික වාර්තාව මසක් ඇතුළත විෂයභාර ඇමැතිවරයා ලෙස ජනාධිපතිවරයා වෙත භාර දීමට කටයුතු කරන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය පවසයි.

ඊට අමතරව මාස හයක පමණ කාලයක් ඇතුළත සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කිරීමට හැකි වනු ඇතැයි ඒ මහත්මිය විශ්වාසය පළ කරයි. ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වසර දහයකට වරක් පවත්වන අතර, මේ සංගණනයේ පළමු වැනි අදියර ලෙස මුළු දිවයිනේම ග්‍රාම නිලධාරී කොට්ඨාසය පදනම් කරගනිමින් සංගණන කාණ්ඩ ලෙස කුඩා කොටස්වලට වෙන් කර, සිතියම්ගත කරන ලද බවත්, එම සිතියම පදනම් කරගනිමින් දෙවැනි අදියර වන ගොඩනැගිලි හා ඒකක රතු ලේඛලයක් අලවා ලැයිස්තුගත කිරීම 2023 වසරේ සිදු කළ බවත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියයි.

ඒ ලැයිස්තුව පදනම් කරගනිමින් රටේ ජීවත් වන සියලු පුද්ගලයන්ගේ හා නිවාසවල තොරතුරු රැස් කිරීම 2024 ඔක්තෝබර් 7 දින ආරම්භ කරන ලද අතර, එය 2024 දෙසැම්බර් 23 දිනෙන් අවසන් වීමට නියමිතව පැවති අතර, මේ කටයුත්තද පෙරේදා (18) සාර්ථකව අවසන් කරන ලදි. මීට අමතරව සාමාන්‍ය පදිංචියක් සහිත පුද්ගලයන්ගෙන් ගත් තොරතුරු 'සංගණන දිනය' ලෙස හඳුනාගත් ඊයේ (19) දිනය පදනම් කරගනිමින් සංශෝධනය කිරීම දෙසැම්බර් 19 සිට දෙසැම්බර් 23 දක්වා සිදු වේ.